# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම -2025
## භූගෝල විද්‍යාව

විභාග අංකය / නම : ..........................................................................................................

| 6 ශ්‍රේණිය | | කාලය පැය 02 |
|---|---|---|

### I කොටස

❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- **අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ශ්‍රී ලංකාවේ විශාලතම පරිපාලන ඒකකය වන්නේ;

   I. ග්‍රාම නිලධාරි කොට්ඨාසය යි  II. පළාත යි
   III. දිස්ත්‍රික්කය යි  IV. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යි.

2. දිස්ත්‍රික්ක තුනක් ඇති පළාතක් වනුයේ;

   I. ඌව පළාත යි  II. උතුරු මැද පළාත යි
   III. නැගෙනහිර පළාත යි  IV. සබරගමුව පළාත යි

3. දිශාව හඳුනා ගැනීම සඳහා භාවිතා කරන උපකරණය කුමක් ද?

   I. සුළං දිශා දර්ශකය  II. මාලිමාව
   III. අනිලමානය  IV. උෂ්ණත්වමානය

4. උතුරු පළාතේ වගා කරන බෝගයකි,

   I. තේ  II. කැරට්
   III. දුම්කොළ  IV. ගෝවා

5. පහත සඳහන් පිළිතුරු අතුරෙන් කාලගුණික අංගයක් නොවන්නේ කවරක් ද?

   I. උෂ්ණත්වය  II. වර්ෂාපතනය
   III. සුළං  IV. ගංවතුර

- **අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස් තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

  ( සුළගේ වේගය, උද්‍යාන, තට්ටු ගොඩනැගිලි, උෂ්ණත්වය, පොල් වගාව)

6. .................................. නාගරික පරිසරයක පිහිටි නිවසකි.
7. තැනිතලා ප්‍රදේශවල .................................. ව්‍යාප්ත වී ඇත.
8. මිනිසා විසින් නිර්මාණය කරන භූගෝලීය ලක්ෂණයක් වන්නේ .................................. යි.
9. අනිලමානය මගින් .................................. මනිනු ලබයි.
10. ෆැරන්හයිට් අංශක හා සෙල්සියස් අංශක යන ඒකකවලින් .................................. මනිනු ලබයි.

- **අංක 11 සිට 15 තෙක් ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 11. කුණු කසල කා දැමීමට උදව්වන සත්ත්වයා වන්නේ | ගැඩවිල් පණුවා |
| 12. ලංකාවේ පැදුරු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශය | මීයා |
| 13. මහාමාරිය ඇති කරන සත්ත්වයෙකි | පිළිමතලාව |
| 14. පිත්තල භාණ්ඩ නිෂ්පාදනය සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශය | කපුටා |
| 15. කෘෂිකාර්මික කටයුතුවල දී පස සරු කිරීමට දායකවන සත්ත්වයා | දුම්බර |

- **16 සිට 20 දක්වා ඇති ප්‍රකාශ නිවැරදි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( ✗ ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

16. පාසලක් පිහිටා ඇති කුඩාම පරිපාලන ඒකකය දිස්ත්‍රික්කය යි. (   )
17. ශාක මඟින් ආහාර හා ඖෂධ ලබා දෙයි. (   )
18. ජලය භාවිතා කර විදුලි බලය නිපදවිය හැකිය. (   )
19. වායු දූෂණය මඟින් අම්ල වැසි ඇති වේ. (   )
20. මුළුතැන්ගෙයින් ඉවතලන අපද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන ජීව වායු උත්පාදනය කළ හැකිය.(   )

( ලකුණු 02 × 20 = 40 )

## I I කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **අනෙකුත් ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

**(01). පහත 1 රූපය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**




1 රූපය

I. උද්‍යානය .................................... දිශාව හා ගිණිකොන දිශාව අතර පිහිටා ඇත.

II. බැංකුවට ප්‍රතිවිරුද්ධ දිශාවේ පිහිටා ඇති ස්ථානය කුමක්ද?

III. නැගෙනහිර දිශාවේ පිහිටා ඇති ස්ථානය කුමක්ද?

IV. ජලාශය පිහිටියේ උසාවියට .................................... දිශාවෙන් ය.

V. පොලිසිය පිහිටා ඇත්තේ .................................... දිශාවෙන් ය.

VI. හිරු බැසයන දිශාවේ පිහිටා ඇති ස්ථානය කුමකද?

VII. තැපැල් කාර්යාලය පිහිටා ඇත්තේ පාසලට .................................... දිශාවෙන් ය.

VIII. තැපැල් කාර්යාලය හා ජලාශය අතර .................................... දිශාවෙන් බැංකුව පිහිටා ඇත.

( ලකුණු 02 × 8 = 16 )

**(02). පහත සඳහන් කාලගුණ වාර්තාව අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

"ගත වූ පැය 24 තුළ උපරිම උෂ්ණත්වය 36.6 $^{0}$C පොතුවිල් ද අවම උෂ්ණත්වය 13.7 $^{0}$C නුවරඑළියෙන් ද වැඩිම වර්ෂාපතනය 16.2 mm කොළඹ දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වේ. දිවයින හරහා සහ දිවයින අවට මුහුදු ප්‍රදේශවල සුළං වේගය පැයට කිලෝමීටර 30 පමණ දක්වා විය හැකිය."

I. ඉහත කාලගුණ වාර්තාවට අනුව අවම උෂ්ණත්වය හා එය වාර්තා වූ ප්‍රදේශය දක්වන්න. (ලකුණු 02)

II. වැඩිම වර්ෂාපතනය හා එය වාර්තා වූ ප්‍රදේශය දක්වන්න. (ලකුණු 02)

III. සුළගේ වේගය පිළිබඳව දක්වා ඇති අනාවැකිය කුමක්ද? (ලකුණු 03)

IV. පහත 2 රූපයෙහි දැක්වෙන්නේ වර්ෂාව ඇතිවන ආකාරය දක්වන දළ ආකෘතියකි එහි හිස්තැනට සුදුසු වචනය අදාළ ලේබලය සමඟ ලියා දක්වන්න (ලකුණු 04)



2 රූපය

A. ..............................................

B. ..............................................

C. ..............................................

D. ..............................................

(03).

I. පහත 3 රූපයේ හඳුනාගත හැකි ආගමික සිද්ධස්ථාන හතර නම් කරන්න. (ලකුණු 02)




3 රූපය

A. ...............................................

B. ...............................................

C. ...............................................

D. ...............................................

II. මිනිසුන් ජාති, ආගම් භේද නොතකා එකමුතු වී කටයුතු කරන අවස්ථා 02 ක් ලියන්න. (ලකුණු 02)

III. ශ්‍රී ලංකාවේ වාසය කරන ප්‍රධාන ජනවර්ග 03 ක් ලියන්න. (ලකුණු 03)

IV. ඔබ ඉහතින් සඳහන් කළ ප්‍රධාන ජනවර්ග 03, එම ජනවර්ග අදහන ප්‍රධාන ආගම, ආගම හා සම්බන්ධ උත්සවය බැගින් ලියා පහත වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 0.5X8=04)

| ප්‍රධාන ජන වර්ගය | ආගම | උත්සවය |
|---|---|---|
| 1 ............... | ................................. | ................................. |
| 2 ............... | ................................. | තෛයිපොංගල් |
| 3 ............... | ................................. | ................................. |

(04).

I. ඔබ ජීවත් වන ප්‍රදේශයේ පවත්නා සේවාවන් 02 ක් ලියන්න. (ලකුණු 02)

II. ශ්‍රී ලංකා රජය මැදිහත් වී සහනදායී මිලකට ලබා දෙන සේවාවන් 02 ක් නම් කරන්න. (ලකුණු 02

III. පාසල් සිසුවෙකු වශයෙන් ඔබ භුක්ති විඳින සේවාවන් 03 ක් ලියන්න. (ලකුණු 03)

IV. ඉහත සේවාවන් භුක්ති විඳීමේ දී ඔබගෙන් ඉටුවිය යුතු යුතුකම් 04 ක් ලියන්න. (ලකුණු 04)

(05).

I.මිනිසා විසින් භූමිය සම්පතක් ලෙස ප්‍රයෝජනයට ගන්නා අවස්ථා 02 ක් ලියන්න. (ලකුණු 02)

II. මිනිසා විසින් භූමිය අවිධිමත් ලෙස පරිහරණය කරන ආකාර 02 ක් දක්වන්න. (ලකුණු 02)

III.භූමිය අවිධිමත්ව පරිහරණය කිරීමෙන් ඇතිවන ප්‍රතිවිපාක 03 ක් ලියන්න. (ලකුණු 03)

IV.භූමිය ආරක්ෂා කිරීමට අපට කළ හැකි දේවල් 02 ක් ලියන්න. (ලකුණු 04)

(06). පහත දැක්වෙන ශ්‍රී ලංකා සිතියම ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

I. ඔබගේ පාසල පිහිටා ඇති දිස්ත්‍රික්කයට මායිම් වන දිස්ත්‍රික්කයක අක්ෂරයක් ලියා දක්වන්න .............
(ලකුණු 02)

II. වයඹ පළාතට අයත් දිස්ත්‍රික්කයක් දැක්වෙන අක්ෂරයක් ලියන්න. ...........................
(ලකුණු 02)

III. දකුණු පළාතට අයත් දිස්ත්‍රික්ක ගණන කීය ද ?
.....................
මෙම සිතියමෙහි දකුණු පළාතට අයත් දිස්ත්‍රික්ක නම්කර ඇති අක්ෂර ලියන්න. ............................
(ලකුණු 03)

IV. වැඩිම දිස්ත්‍රික්ක ප්‍රමාණයක් ඇති පළාත කුමක් ද?
එම පළාතට
අයත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න.
(ලකුණු 04)

.........................................................
.........................................................



(07).

I. ඔබගේ නිවැසියන් විවිධ අවශ්‍යතා සඳහා ජලය ලබා ගන්නා ක්‍රම (මූලාශ්‍ර) 02ක් සඳහන් කරන්න. (ලකුණු 02)

II. ජලය දූෂණය විය හැකි ක්‍රම 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)

III. ජල දූෂණය නිසා ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)

IV. ජලය තිරසාරව පවත්වා ගැනීම සඳහා ගත හැකි පියවර 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)